049

ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය
කළමනාකරණ අධ්‍යයන පීඨය

කළමනාකරණ අධ්‍යයනවේදී ගෞරව උපාධිය
ගිණුම්කරණ සහ මූල්‍ය - කළමනාකරණ අධ්‍යයනවේදී ගෞරව උපාධිය
මානව සම්පත් කළමනාකරණ - කළමනාකරණ අධ්‍යයනවේදී ගෞරව උපාධිය
අලෙවි කළමනාකරණ - කළමනාකරණ අධ්‍යයනවේදී ගෞරව උපාධිය

**AFU 3572 - සූක්ෂම ආර්ථික විද්‍යාව**
**අඛණ්ඩ ඇගයීම් පරීක්ෂණය - 2023 / 2024**
**කාලය - පැය දෙක (02)**

*දිනය: 2024 මාර්තු 23* *වේලාව: පෙ.ව. 9.30 - පෙ.ව. 11.30.*

විභාග අංකය. ..................................

**පිළිතුරු පත්‍රය (බහුවරණ ප්‍රශ්න)**

ලබා දී ඇති පිළිතුරු හතරෙන් නිවැරදි පිළිතුරේ අංකය පිළිතුරු පත්‍රයේ අදාළ ප්‍රශ්න අංකයට ඉදිරියෙන් ලියන්න. ලබා දී ඇති ඉඩෙහි පිළිතුරු අංක එකකට වඩා ලිවීම සඳහා ලකුණු ලබා නොදෙන බව සලකන්න.

| ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය |
|---|---|
| 1. | |
| 2. | |
| 3. | |
| 4. | |
| 5. | |
| 6. | |
| 7. | |
| 8. | |
| 9. | |
| 10. | |

| ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය |
|---|---|
| 11. | |
| 12. | |
| 13. | |
| 14. | |
| 15. | |
| 16. | |
| 17. | |
| 18. | |
| 19 | |
| 20 | |

**ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය**
**කළමනාකරණ අධ්‍යයන පීඨය**

**කළමනාකරණ අධ්‍යයනවේදී ගෞරව උපාධිය**
**ගිණුම්කරණ සහ මූල්‍ය - කළමනාකරණ අධ්‍යයනවේදී ගෞරව උපාධිය**
**මානව සම්පත් කළමනාකරණ - කළමනාකරණ අධ්‍යයනවේදී ගෞරව උපාධිය**
**අලෙවි කළමනාකරණ - කළමනාකරණ අධ්‍යයනවේදී ගෞරව උපාධිය**

**AFU 3572 සුක්ෂම ආර්ථික විද්‍යාව**
**අඛණ්ඩ ඇගයීම් පරීක්ෂණය - 2023 / 2024**
**කාලය - පැය දෙකයි (02)**

***දිනය: 2024 මාර්තු 23*** ***වේලාව: පෙ.ව. 9.30 - පෙ.ව. 11.30.***

**මෙම ප්‍රශ්න පත්‍රය - I කොටස (බහුවරණ ප්‍රශ්න) සහ II කොටස (රචන ආකාරයේ ප්‍රශ්න) වලින් සමන්විත වේ. I කොටසෙ** සහ **II කොටසේ සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**

***වැඩසටහන් සම්පාදනය කළ නොහැකි ගණක යන්ත්‍ර භාවිතා කිරීමට අවසර ඇත.***

***උපදෙස්:***

- I කොටස **ලකුණු 40ක්** සහිත බහුවරණ ප්‍රශ්න විස්ස (20) කින් සමන්විත වේ. **(ලකුණු 2 x 20)**
- ප්‍රශ්න පත්‍රයේ I කොටසෙහි බහුවරණ ප්‍රශ්නවලට අදාළ පිළිතුරු, සපයා ඇති පිළිතුරු පත්‍රයේ ලකුණු කරන්න. සෑම ප්‍රශ්නයකටම ප්‍රශ්න පත්‍රයේ දක්වා ඇති පිළිතුරු විකල්ප හතරෙන් නිවැරදි පිළිතුර තෝරා ගැනීම අවශ්‍ය වේ.
- ප්‍රශ්න පත්‍රයේ II කොටසේ දක්වා ඇති සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
- කරුණාකර ඔබේ විභාග අංකය පිළිතුරු පත්‍රයේ ඉහළින් ලබා දී ඇති ඉඩෙහි දක්වන්න
- මෙම ප්‍රශ්න පත්‍රය පිටු පහකින් (5) සමන්විත වේ.
- පිළිතුරු පත්‍රය ඔබේ පිළිතුරු පොත් පිංචට අමුණන්න.

## බහු වර්ණ ප්‍රශ්න පත්‍රය I කොටස

1. සුක්ෂම ආර්ථික විද්‍යාව යටතේ අධ්‍යයනය **නොකරන්නේ** පහත ඒවායින් කුමක් ද?

   i. සැබෑ ලෝකයේ සමාගම්වල මිල සහ නිමැවුම් තීරණ.
   ii. ආර්ථිකයේ සාමාන්‍ය මිල මට්ටමේ හැසිරීම.
   iii. භාණ්ඩයකට උපරිම නෛතික මිලක් පැනවීමේ බලපෑම.
   iv. වෙනස් වන පාරිභෝගික ආදායම, සුඛෝපභෝගී භාණ්ඩ සඳහා වන ඉල්ලුමට බලපාන ආකාරය.

2. කිසියම් කටයුත්තක ආවස්ථික පිරිවැය වන්නේ,

   i. කැපකරන ලද ආදායම පමණි.
   ii. කැපකරන ලද ආදායම හෝ එම කටයුත්ත කිරීමේදී ඇතිවන මුල්‍ය පිරිවැයයි.
   iii. එම කටයුත්ත කිරීමේදී ඇතිවන මුල්‍ය පිරිවැය පමණි.
   iv. එම කටයුත්ත කිරීමේදී ඇතිවන මුල්‍ය පිරිවැය සහ කැපකරන ලද ආදායම යන දෙකම.

3. පහත සඳහන් ඒවායින් නොමිල භාණ්ඩයක (Free Good) ලක්ෂණයක්/ ලක්ෂණ වනුයේ මොනවාද?

A. හිඟතාවයක් නොපවතී
B. හිඟතාවයක් පවතී
C. ආවස්ථික පිරිවැයක් පවතී
D. ආවස්ථික පිරිවැයක් ශූන්‍ය වේ.

i. A සහ D පමණි,
ii. B සහ C පමණි,
iii. C සහ D පමණි,
iv. B සහ D පමණි.

4 නිෂ්පාදන හැකියා මායිම් වක්‍ර විශ්ලේෂණයේදී කරන ලද පහත උපකල්පන වලින් **වැරදි** මොනවාද?

i. සලකා බලන කාල සීමාව තුළ ආර්ථිකයේ සම්පත් ප්‍රමාණය ස්ථාවර වේ.
ii. ලබා දී ඇති භාණ්ඩ දෙක නිෂ්පාදනය කිරීම සඳහා සම්පත් ඕනෑම ආකාරයකින් සංයෝජනය කළ හැකිය.
iii. භාණ්ඩ දෙක නිෂ්පාදනයේදී පවතින සම්පත් එක හා සමාන ලෙස හොඳින් භාවිතා කල හැකිය.
iv. සලකා බලනු ලබන කාල සීමාව තුළ තාක්ෂණය නොවෙනස්ව පවතී.

5. නිෂ්පාදන හැකියා මායිම් වක්‍රය ඇතුළත ඕනෑම ලක්ෂ්‍යයක් නිරූපණය කරනුයේ

i. සම්පත් හිඟකම.
ii. සම්පත් අකාර්යක්ෂම ලෙස උපයෝජනය.
iii. ලඟා කරගත නොහැකි නිෂ්පාදන මට්ටම්.
iv. සම්පත් කාර්යක්ෂමව උපයෝජනය.

6. ධනේශ්වර/නිදහස් වෙළඳපොල ආර්ථිකයක ලක්ෂණයක් **නොවන්නේ** පහත ඒවායින් කුමක් ද?

i. මධ්‍යගත සැලසුම් කිරීම.
ii. මිල යාන්ත්‍රණය හරහා සම්පත් කාර්යක්ෂමව බෙදා හැරීම.
iii. නිෂ්පාදන සාධකවල අයිතිය පුද්ගලික අංශය සතුය.
iv. ලාභ අපේක්ෂාවෙන් විවිධ ක්‍රියාකාරකම් සිදු කිරීම.

7. පහත සඳහන් ඒවායින් අභිමථානුරූපී "Normative" ප්‍රකාශය කුමක්ද?

i. රටක සියලුම පුරවැසියන්ට රජය විසින් මූලික සෞඛ්‍ය පහසුකම් සැපයිය යුතුය.
ii. බදු වැඩි කිරීම නිසා ජනතාවගේ පරිභෝජන වියදම අඩු වේ.
iii. ඉන්ධන සඳහා ඇති ඉල්ලුම ඉන්ධන මිල සමග ප්‍රතිලෝමව සම්බන්ධ වේ.
iv. මිනිසුන්ගේ අසීමිත අවශ්‍යතා සපුරාලීම සඳහා ආර්ථිකයට ඇත්තේ සීමිත සම්පත්ය.

8. මිනිසුන්ගේ සැබෑ ආදායම වැඩිවීම නිසා පොදු ප්‍රවාහනය සඳහා ඇති ඉල්ලුම අඩු වී ඇත පොදු ප්‍රවාහනය යනු,

i. සාමාන්‍ය භාණ්ඩයකි (Normal Good)
ii. අත්‍යාවශ්‍ය භාණ්ඩයකි (Essential Good)
iii. බාල භාණ්ඩයකි (Inferior Good)
iv. පොදු භාණ්ඩයකි. (Public Good)

9. X භාණ්ඩයේ ඉල්ලුම් වක්‍රය අඳින විට පහත සඳහන් දේවලින් නියතව පවතින්නේ කුමක් ද?

A. X භාණ්ඩයේ ආදේශකවල මිල.
B. පාරිභෝගික ආදායම

C. X භාණ්ඩයේ මිල
D. X භාණ්ඩයේ අනුපූරක භාණ්ඩවල මිල.

i. C පමණි
ii. A සහ B පමණි
iii. A සහ C පමණි
iv. A, B සහ D පමණි

10. X සහ Y භාණ්ඩ අතර ඉල්ලුමේ හරස් මිල නම්‍යතා අගය ධනාත්මක නම්, X භාණ්ඩයේ මිල වැඩි වන විට,

i. Y භාණ්ඩය සඳහා ඇති ඉල්ලුම අඩු වේ.
ii. Y භාණ්ඩය සඳහා ඉල්ලුම වැඩි වේ
iii. Y භාණ්ඩය සඳහා ඉල්ලුම් ප්‍රමාණය අඩු වේ.
iv. Y භාණ්ඩය සඳහා ඉල්ලුම් ප්‍රමාණය වැඩි වේ.

11. නුදුරු අනාගතයේ දී කිරිපිටි මිල ඉහළ යාමට අපේක්ෂිත විට;

i. කිරිපිටි සඳහා වත්මන් ඉල්ලුම සහ වත්මන් සැපයුම යන දෙකම පහත වැටෙනු ඇත.
ii. කිරිපිටි සඳහා පවතින ඉල්ලුමේ සහ සැපයුමේ වෙනසක් සිදු නොවනු ඇත.
iii. කිරිපිටි සඳහා වත්මන් ඉල්ලුම පහත වැටෙන අතර වත්මන් කිරිපිටි සැපයුම වැඩි වනු ඇත.
iv. කිරිපිටි සඳහා වත්මන් ඉල්ලුම වැඩි වන අතර වත්මන් කිරිපිටි සැපයුම අඩු වනු ඇත.

12. ඉල්ලුම් නීතියේ සඳහන් වන්නේ අනෙකුත් සාධක නියතව පවතින විට භාණ්ඩයක මිල පහත වැටෙන විට

i. එම භාණ්ඩයේ ඉල්ලුම් ප්‍රමාණය අඩු වේ.
ii. එම භාණ්ඩයේ ඉල්ලුම වැඩි වේ.
iii. එම භාණ්ඩයේ ඉල්ලුම් ප්‍රමාණය වැඩි වේ.
iv. එම භාණ්ඩයෙ ඉල්ලුම අඩු වේ.

13. බිත්තර සහ මාගරින් මිල වැඩි වූ විට,

i. කේක් වල සැපයුම් වක්‍රය දකුණට විතැන් වේ.
ii. කේක් සඳහා ඉල්ලුම වක්රය වමට විතැන් වේ.
iii. කේක් වල සැපයුම් වක්‍රය වමට විතැන් වේ.
iv. කේක් සඳහා ඉල්ලුම වක්රය දකුණට විතැන් වේ.

14. "X" හි සැපයුම් ශ්‍රිතය $Qs = - 96 + 12P$ ($Qs$ = ප්‍රමාණය සහ $P$ = මිල) ලෙස ලබා දී ඇත; නිෂ්පාදනය කරනු ලබන සෑම ඒකකයකුටම රු.3/= ක සහනාධාරයක් ලබා දෙන්නේ නම්, සහනාධාරයෙන් පසු සැපයුම් සමීකරණය;

i. $- 60 + 12P$
ii. $- 93 + 12P$
iii. $- 96 + 9P$
iv. $- 132 + 12P$

15. X භාණ්ඩයේ සැපයුම මත ඒකක බද්දක් පැනවූ විට,

i. X භාණ්ඩයේ සමතුලිත මිල සහ ප්‍රමාණය යන දෙකම පහත වැටේ.
ii. X භාණ්ඩයේ සමතුලිත මිල එලෙසම පවතින අතර සමතුලිතතා ප්‍රමාණය ඉහළ යයි.
iii. X භාණ්ඩයේ සමතුලිත මිල සහ ප්‍රමාණය යන දෙකම වැඩි වේ.
iv. X භාණ්ඩයේ සමතුලිත මිල වැඩි වන අතර සමතුලිතතා ප්‍රමාණය අඩු වේ.

16. රජය සහල් කිලෝවක් මත සමතුලිත මිලට වඩා අඩු උපරිම නෛතික මිලක් පනවන විට;

A. එය වෙළඳපොලේ සහල් අතිරික්තයක් ඇති කරයි,
B. එය වෙළෙඳපොළේ සහල් හිඟයක් ඇති කරයි.
C. දේශීය සහල් නිෂ්පාදකයින් දිරිමත් කරනු ඇත,
D. එය සහල් සඳහා කළු වෙළෙඳපොළක් නිර්මාණය කළ හැකිය.

i. A සහ C පමණක් නිවැරදි වේ.
ii. B සහ D පමණක් නිවැරදි වේ.
iii. B, C සහ D පමණක් නිවැරදි වේ.
iv. D පමණක් නිවැරදි වේ.

17. X භාණ්ඩයෙන් උපයන ලද මුළු ආදායම අඩුවනු ලබන්නේ,

i. X භාණ්ඩයේ ඉල්ලුම නම්‍යව පවතින විට, මිල වැඩි කිරීමෙන්ය.
ii. X භාණ්ඩයේ ඉල්ලුම අනම්‍යව පවතින විට, මිල වැඩි කිරීමෙන්ය.
iii. X භාණ්ඩයේ ඉල්ලුම නම්‍යව පවතින විට, මිල අඩු කිරීමෙන්ය.
iv. X භාණ්ඩයේ ඉල්ලුම ඒකීය නම්‍යව පවතින විට, මිල වැඩි කිරීමෙන්ය.

18. පාරිභෝගිකයන් භාණ්ඩයක් සඳහා තම ආදායමෙන් ඉතා විශාල ප්‍රතිශතයක් වැය කරන විට එම භාණ්ඩයේ මිල ඉල්ලුමේ නම්‍යතාවයෙ ස්වභාවය වන්නේ,

i. පූර්ණ නම්‍ය
ii. පූර්ණ අනම්‍ය
iii. ඉතා අනම්‍ය
iv. ඉතා නම්‍ය

19. X භාණ්ඩයේ ඉල්ලුමේ ආදායම් නම්‍යතාව + 0.48 වේ, එබැවින් X භාණ්ඩය යනු

i. බාල භාණ්ඩයකි
ii. අත්‍යවශ්‍ය භාණ්ඩයකි
iii. සුඛෝපභෝගී භාණ්ඩයකි
iv. ගිෆන් භාණ්ඩයකි

20. පූර්ණ නම්‍ය ඉල්ලුම් වක්‍රයක් සහිත භාණ්ඩයක් මත සඳහා එහි සැපයුම මත බද්දක් පැනවූ විට;

i. සම්පූර්ණ බදු බර සැපයුම්කරුවන් විසින් දරනු ලබන අතර සමතුලිත ප්‍රමාණය පහත වැටේ.
ii. සම්පූර්ණ බදු බර ගැනුම්කරුවන් විසින් දරනු ලබන අතර සමතුලිත ප්‍රමාණය පහත වැටේ.
iii. බදු බර ගැනුම්කරුවන් සහ සැපයුම්කරුවන් අතර සමානව බෙදී යයි.
iv. සම්පූර්ණ බදු බර සැපයුම්කරුවන් විසින් දරනු ලබන අතර සමතුලිත ප්‍රමාණය වැඩි වේ.

## II කොටස

**සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න**
**සියලුම ප්‍රශ්න වලට සමාන ලකුණු හිමිවේ (ලකුණු 30 බැගින්)**

**<u>ප්‍රශ්නය අංක 1.</u>**

A. a. සමහර භාණ්ඩ සඳහා ධනාත්මක ලෙස බෑවුම් සහිත ඉල්ලුම් වක්‍රයක් තිබිය හැක" ඔබ එකඟද? උදාහරණ භාවිතයෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

b. පහත සඳහන් වෙනස්කම් අදාළ වෙළඳපොළට බලපාන්නේ කෙසේද? රූපසටහන් භාවිතයෙන් පැහැදිලි කරන්න.

i. දිගු නියගය දකුණේ කෙසෙල් වගාව විනාශ කර ඇත, කෙසෙල් සඳහා වන වෙළෙඳපොළ
ii. වැඩි වැඩියෙන් මිනිසුන් කාබනික ගොවිතැනට පිවිස ඇත. කාබනික පොහොර භාවිතයෙන් නිෂ්පාදනය කරන එළවළු සඳහා වන වෙළඳපොළ.
iii. සැකසූ මස් පරිභෝජනය මිනිස් සෞඛ්‍යයට අහිතකර බව වෛද්‍ය වාර්තාවක් හෙළි කරයි. සැකසූ මස් සඳහා වන වෙළෙඳපොළ
iv. තාක්ෂණික දියුණුව නිසා වී ගොවිතැනේ පසු අස්වනු හානිය අඩු වී ඇත. සහල් සඳහා වන වෙළෙඳපොළ. (ලකුණු 12)

B. X භාණ්ඩයේ සඳහා ඉල්ලුම සහ සැපයුම් සමීකරණ ලබා දී ඇත;

Qd = 112 – 4P, Qs = -80 + 8P මිල රුපියල් වලින් සහ ප්‍රමාණය ඒකක වලින්. (Q = ප්‍රමාණය සහ ප්‍රමාණය, P = මිල) ඔබේ පිළිතුර පැහැදිලි කිරීමට අවශ්‍ය අවස්ථාවලදී රූපසටහන් සපයන්න.

i. සමතුලිත ලක්ෂයයේ මිල සහ ප්‍රමාණය සොයන්න. (ලකුණු 03)
ii. රජය X භාණ්ඩය මත රු. 20/= ක, අවම නීතිමය මිලක් පනවයි නම් X භාණ්ඩය සඳහා වන වෙළඳපල හැසිරෙන්නේ කෙසේද? අවම නීතිමය මිලක් පැනවීමේ ආර්ථික ප්‍රතිවිපාක මොනවාද? පැහැදිලි කරන්න. (ලකුණු 07)
iii. වෙළඳපොල තුල X භාණ්ඩය ඉල්ලුම් කරන එක හා සමාන පාරිභෝගිකයින් 10,000 ක් සහ නිෂ්පාදකයින් 1000 ක් සිටී නම් X භාණ්ඩයෙහි වෙළඳපල ඉල්ලුම සහ වෙළඳපල සැපයුම් සමීකරණ ව්‍යුත්පන්න කරන්න. (ලකුණු 03)

**ප්‍රශ්නය අංක 2.**

A. i. මිල සැපයුම් නම්‍යතාවය යන්නෙන් අදහස් කරන්නේ කුමක්ද? උදාහරණ සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 03)
ii. මිල සැපයුම් නම්‍යතාවය තීරණය කරන සාධක මොනවාද? පැහැදිලි කරන්න. (ලකුණු 05)
iii. භාණ්ඩයක සැපයුම් සමීකරණය Qs = -56 +8P නම්, (P) මිල රුපියල් වලින්, (Qs) ප්‍රමාණය ඒකක වලින් සපයනු ලැබේ, ලබා දී ඇති භාණ්ඩයේ මිල රු. 12/= වූ විට, මිල සැපයුම් නම්‍යතාවය ගණනය කරන්න සහ නම්‍යතා සංගුණකය ගැන අදහස් දක්වන්න. (ලකුණු 06)

B. පහත සඳහන් ප්‍රකාශයන් සමග ඔබ "එකඟ වන්නේද" යන්න පැහැදිලි කරන්න.

i. භාණ්ඩයක නිෂ්පාදන පිරිවැය වැඩි වන තරමට දී ඇති භාණ්ඩයේ මිල සැපයුම් නම්‍යතාවයේ අගය වැඩි වේ
ii. සලකා බලන කාල සීමාව වැඩි වන තරමට දී ඇති භාණ්ඩයෙ මිල සැපයුම් නම්‍යතාවයේ අගය වැඩි වේ (ලකුණු 08)

A. පාරිභෝගික සමතුලිතතාවය
i. සංඛ්‍යා සූචක ක්‍රමවේදය (Cardinal Utility Approach)
ii. ක්‍රම සූචක ක්‍රමවේදය (Ordinal Utility Approach)

භාවිතා කරමින් පැහැදිලි කරන්නේ කෙසේද, අවශ්‍ය අවස්ථාවලදී රූපසටහන් /උදාහරණ භාවිතා කරමින් පැහැදිලි කරන්න (ලකුණු 08)

*සියලුම හිමිකම් ඇවිරිණි.*